රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 11/2019

මගේ අංකය: EST-3/DICIP/06/0275
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.05.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ බුලත් විට, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සහ විකිණීම තහනම් කිරීම

රාජ්‍ය ආයතන තුළ දුම්පානය තහනම් කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 1999.03.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/99ට වැඩිමනත් වශයෙනි.

02. අංක 1982/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2016.09.01 දින සිට දුම් රහිත දුම්කොළ අඩංගු ද්‍රව්‍ය නිෂ්පාදනය, ආනයනය, විකිණීම හා විකිණීමට ඉදිරිපත් කිරීම ද තහනම් කර ඇති බැවින් සහ ශ්‍රී ලංකාවේ විශේෂයෙන් ම පිරිමි පාර්ශවය අතර බහුලව ම පවතින මුඛ පිළිකාව සඳහා බලපාන ප්‍රධාන අවදානම් සාධක අඩු කිරීමට පිළියමක් ලෙස බුලත් විට, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු බවට 2019.03.12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව,

I. සියලුම රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ බුලත් විට, දුම්කොළ, පුවක් සහ ඒවා ආශ්‍රිත නිෂ්පාදන භාවිතය තහනම් වේ.

II. එම ආයතනවලට අයත් ආපනශාලාවල බුලත් විට, දුම්කොළ, පුවක් හා ඒවා ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය නැවැත්විය යුතු ය.

04. ඉහත විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතු ය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය